# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1888/43 – 2014 නොවැම්බර් 14 වැනි සිකුරාදා – 2014.11.14

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

5 වැනි වගන්තිය යටතේ ප්‍රකාශය

මෙහි පහත විස්තර කරනු ලැබූ ඉඩම්, පොදුජන කටයුත්තක් සඳහා අවශ්‍ය බවත්, ඒවා ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධිවිධාන යටතේ අත්කර ගනු ලබන බවත්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ, ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍ය ජනක බණ්ඩාර තෙන්නකෝන් වන මම, මෙයින් ප්‍රකාශ කරමි.

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, ගම්පහ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, මැද පත්තුව සුළු කොට්ඨාසයේ, ඉහළ ඉඹුල්ගොඩ ගමේ පිහිටි අංක ගම්/ගම්/2014/122 සහ 2014.05.21 දිනැති ප්‍රගමන අනුරේඛනයේ දැක්වෙන ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.1848 ක් පමණ වන පහත සඳහන් නම්වලින් හා ප්‍රමාණවලින් යුත් ඉඩම් කැබලිවලට මායිම්:

01. **කැබලි අංක 01 – වරි. අංක 440, නුවර පාර – ප්‍රමාණය: හෙක්. 0.0135**

උතුරට: නා ගහ කොටුව පාර; නැගෙනහිරට: නා ගහ කොටුව පාර, මු.පි.ගම්. 3854 හි කැබලි අංක 29, 28 (ඇළ) සහ 30; දකුණට: මු.පි.ගම්. 3854 හි කැබලි අංක 30, 33 සහ 2; බටහිරට: කැබලි අංක 2.

02. **කැබලි අංක 02 – මිල්ලගහකුඹුර – ප්‍රමාණය: හෙක්. 0.0774**

උතුරට: මෙම ඉඩමෙහි ඉතිරි කොටස සහ නා ගහ කොටුව පාර; නැගෙනහිරට: කැබලි අංක 1, මු.පි.ගම්. 3854 හි කැබලි අංක 30 සහ 33; දකුණට: මු.පි.ගම්. 3854 හි කැබලි අංක 33, 34, 38 (ඇළ) සහ කැබලි අංක 3; බටහිරට: කැබලි අංක 3, සරත් පද්මකුමාර හිමිකම් කියන මිල්ලගහකුඹුර සහ මෙම ඉඩමෙහි ඉතිරි කොටස.

03. **කැබලි අංක 03 – මිල්ලගහකුඹුර – ප්‍රමාණය: හෙක්. 0.0887**

උතුරට: මෙම ඉඩමෙහි ඉතිරි කොටස, එම්. ජී. පී. ඒ. කුමාර සහ ජයලාල් මල්ලවාරච්චි හිමිකම් කියන මිල්ලගහකුඹුර; නැගෙනහිරට: එම්. ජී. පී. ඒ. කුමාර, ජයලාල් මල්ලවාරච්චි හිමිකම් කියන මිල්ලගහකුඹුර, කැබලි අංක 2, මු.පි.ගම්. 3854 හි කැබලි අංක 38 (ඇළ) සහ කැබලි අංක 37; දකුණට: මු.පි.ගම්. 3854 හි කැබලි අංක 37, 38 (ඇළ) සහ කැබලි අංක 4 (ඇළ); බටහිරට: කැබලි අංක 4 (ඇළ), ඇළ සහ මෙම ඉඩමෙහි ඉතිරි කොටස.

04. **කැබලි අංක 04 – ප්‍රමාණය: හෙක්. 0.0052**

උතුරට: ඇළ, සරත් පද්මකුමාර හිමිකම් කියන මිල්ලගහකුඹුර සහ කැබලි අංක 3; නැගෙනහිරට: කැබලි අංක 3, මු.පි.ගම්. 3854 හි කැබලි අංක 37 සහ 38 (ඇළ); දකුණට: මු.පි.ගම්. 3854 හි කැබලි අංක 38 (ඇළ) සහ පී. කේ. ලීලාරත්න හිමිකම් කියන වරි. අංක 452, නුවර පාර; බටහිරට: පී. කේ. ලීලාරත්න හිමිකම් කියන වරි. අංක 452, නුවර පාර.

ජනක බණ්ඩාර තෙන්නකෝන්,
ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍ය.

මගේ යොමු අංකය :- 4-3/7/2013/එච්ඩබ්ලිව්/668.
ප්‍රාදේශීය ලේකම්ගේ යොමු අංකය : - 2/2/1/125.
2014 නොවැම්බර් මස 13 වැනි දින,
ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය,
'මිහිකත මැදුර', ඉඩම් මහලේකම් කාර්යාලය,
1200/6, රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

11 - 892

1A – G 20606 – 10 (2014/11) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*